කැලණි අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය 2015

ගණිතය

6 ශ්‍රේණිය | කාලය පැය 2 යි.

නම :- ....

I කොටස

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

* සෑම ප්‍රශ්නයකට ම ලකුණු 02 බැගින් හිමි වේ.

01. අවට පරිසරයේ ඇති වෘත්තාකාර හැඩ ඇති වස්තු දෙකක නම් ලියන්න.

02. 9 + 4, 13 සෑදෙන ආකල බන්ධනයකි. එහි තවත් ආකල බන්ධනයක් ලියන්න.

03. 5 732 406 හි සංඛ්‍යා නාමය ලියන්න.

04. අධ්‍යාපන චාරිකාවකට මුළු ළමයි ගණන 122 කි. ඉන් 65 ක් පිරිමි ළමුන් වේ. ඉතිරිය ගැහැණු ළමුන් වේ. චාරිකාවට සහභාගී වූ ගැහැණු ළමයින් ගණන කොපමණ ද?

05. 4700 ÷ 100 හි අගය කොපමණ ද?

06. 7256 හි 2 න් නිරූපණය වන අගය කීය ද ?

07. 

ගණක රාමුවෙන් නිරූපණය වන සංඛ්‍යාව කීය ද?

08. රූපවාහිනී වැඩසටහනක් ආරම්භ වූ වේලාව ප.ව. 4.05 විය. මෙම වේලාව අන්තර්ජාතික සම්මත ක්‍රමයට දක්වන්න.

09. 28 ආසන්න දහයේ ගුණාකාරයට වටයා දක්වන්න.

10. 

පාට කළ කොටසේ ප්‍රමාණය භාගයක් ලෙස දක්වන්න.

11. 5 හා 3 යන සංඛ්‍යා දෙකෙහිම ගුණාකාරයක් වන සංඛ්‍යා දෙකක් ලියන්න.

12. ප්‍රථමක සංඛ්‍යාවක් හෝ සංයුක්ත සංඛ්‍යාවක් නොවන සංඛ්‍යාවක් ලියන්න.

13. දකුණු දිශාව සමග සෘජුකෝණාස්‍රයක් සාදන දිශා දෙක ලියන්න.

14. $2l$ හා $75\ ml$ මිලි ලීටර් වලින් දක්වන්න.

15. සවිධි චතුරස්‍රයක ඇති දාර සංඛ්‍යාව කොපමණ ද?

16. 4, 7, 6 යන සංඛ්‍යා තුන භාවිත කරමින් ලිවිය හැකි විශාලම ඉරට්ටේ සංඛ්‍යාව කොපමණ ද?

17. $1l$ ක බඳුනක් සම්පූර්ණයෙන් ජලයෙන් පිරවීම සඳහා $200\ ml$ පිරවූ ජල බඳුනෙන් ජලය කීවාරයක් දැමිය යුතු ද?

18. පහත දැක්වෙන එක් එක් දශම සංඛ්‍යා යුගලය " < " හෝ " > " හෝ " = " සංකේතය යොදා සම්බන්ධ කරන්න.

(i) 0.09 .... 0.6 (ii) 2.71 .... 2.17

19. කවීෂ පාඩම් කිරීම ආරම්භ කළේ ප.ව. 6.20 ට ය. ඔහු මිනිත්තු 45 ක් පාඩම් කළේ නම් පාඩම් කිරීම අවසන් කර ඇත්තේ කීයට ද?

20. 20 ට අඩු සංඛ්‍යාවක් 3 න් බෙදූ විට 1 ක් ඉතිරි වේ. 5 න් බෙදූ විට 3 ක් ඉතිරි වේ. එම සංඛ්‍යාව කීය ද?

II කොටස

* පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

* පළමුවන ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.

01. (a) ඔබ වෙළඳ පොළට ගිය අවස්ථාව සිහිපත් කර ගන්න. එහිදී දුටු ආහාර ද්‍රව්‍ය කණ්ඩායම් කිහිපයකට වෙන් කිරීමට හැකිදැයි බලන්න.

(i) ආහාර සඳහා ලබාගන්නා දේවල් 10 ක නම් ලැයිස්තුගත කරන්න. (ල. 02)

(ii) ඉහත සඳහන් කළ ආහාර ද්‍රව්‍ය කණ්ඩායම් 3කට වෙන් කර එක් එක් කාණ්ඩය වෙන වෙනම කොටු තුළ ලියන්න. (ල. 02)

(iii) එක් එක් කාණ්ඩවලට වෙන් කිරීමේ දී සැලකිල්ලට භාජනය කළ ලක්ෂණය කුමක්දැයි එක් එක් කාණ්ඩයට අයත් කොටුව යටින් ලියා දක්වන්න. (ල. 03)

(iv) ඉහත කාණ්ඩවලට සුදුසු නමක් යෝජනා කර එම කාණ්ඩයට යටින් ලියන්න. (ල. 03)

(b) පහත රවුම් තුළ දක්වා ඇත්තේ යම් කිසි පොදු ලක්ෂණයකට අනුව කාණ්ඩ 2 කට වෙන් කොට එහි සංඛ්‍යා සමූහයකි.



(i) එසේ කාණ්ඩවලට වෙන් කිරීමට භාවිත කළ ලක්ෂණය කුමක් විය හැකි ද? (ල. 02)

(ii) එම පොදු ලක්ෂණය අනුව කාණ්ඩ සඳහා නමක් යෝජනා කරන්න. (ල. 02)

(iii) රෙදි සාප්පුවක තේරීම හා කාණ්ඩ කිරීම භාවිතයට ගන්නා අවස්ථාවක් ලියන්න. (ල. 01)

02. (a) නිවසක සිටින සහෝදර සහෝදරියන්ගේ වයස නිරූපණය කරන සංඛ්‍යා රේඛාවක් පහත දැක්වේ.



(i) සුමාල්ගේ දූන් වයස කීය ද ? (ල. 01)

(ii) වයසින් වැඩිම දරුවා කවු ද ? (ල. 01)

(iii) සුමාල්ට වයස අවුරුදු 5 ක් වන විට හසිනිගේ වයස කීය ද? (ල. 02)

(iv) නඳුනි ලසිත්ට වඩා අවුරුදු කීයක් වැඩිමහල් ද? (ල. 02)

(b) අගය සොයන්න.

(i) $\frac{1}{4} + \frac{1}{8}$ (ල. 02)

(ii) $\frac{2}{5} - \frac{1}{10}$ (ල. 02)

(iii) $\frac{1}{7}, \frac{1}{5}, \frac{1}{9}$ ආරෝහණ පටිපාටියට ලියන්න. (ල. 01)

03.(a) ඔබ උගත් සංඛ්‍යා රටාවක් පහත දැක්වේ.



(i) මෙම ආකාරයට නිරූපණය කල හැකි සංඛ්‍යා හඳුන්වන නම කුමක් ද? (ල. 02)

(ii) මෙම ආකාරයට සකස් කරන ලද අටවැනි සැකසුමෙන් නිරූපණය වන සංඛ්‍යාව කීය ද? (ල. 02)

(iii) මෙම රටාවේ ඇති අනුයාත සංඛ්‍යා දෙකක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව කුමන වර්ගයකට අයත් වේ ද? (ල. 01)

(b) (i) 1 සිට 20 දක්වා ඇති සමචතුරස්‍ර සංඛ්‍යා පිළිවෙලින් ලියන්න. (ල. 02)

(ii) ඉහත සංඛ්‍යා රාටාවේ ඇති පස්වැනි පදය සොයන්න. (ල. 02)

(iii) පස්වැනි පදය තිත් සටහනකින් නිරූපණය කරන්න. (ල. 02)

04.(a)



ඉහතින් දක්වා ඇත්තේ කොටු රූල් කඩදාසියක ඇති රූපයකි.

(i) ඉංග්‍රීසි අක්ෂර වලින් දක්වා ඇති තල රූප හැඳින්වෙන නම් ලියන්න (ල. 05)

(ii) B හා C තල රූප වර්ග දෙක එකිනෙකට වෙනස්වන ලක්ෂණයක් ලියන්න. (ල. 02)

(b) පහත දැක්වෙන්නේ පැති එකිනෙකට සමාන වූ ලේන්සුවකි. එක් පැත්තක දිග 15 cm වේ.



(i) එම ලේන්සුවේ පරිමිතිය සොයන්න. (ල. 02)

(ii) ලේන්සුව වටා රිබන් පේළි 2 ක් ඇල්ලීමට අවශ්‍ය රිබන්වල දිග කොපමණ ද? (ල. 01)

(iii) රිබන් පටිවල දිග මීටර් වලින් සොයන්න. (ල. 01)

05.(a) පහත දක්වා ඇත්තේ විවිධ වර්ගයේ කෝණ වේ.



පහත දක්වා ඇති කෝණ වර්ගවලට අදාල නිවැරදි අක්ෂරය කෝණ වර්ගය ඉදිරියෙන් ලියන්න.

(i) සුළු කෝණය
(ii) මහා කෝණය
(iii) සරල කෝණය
(iv) පරාවර්තන කෝණය
(v) සෘජු කෝණය

(ල. 05)

(b) සචිනි තම නිවසේ සිට 10 m ක් උතුරට ගොස් 15 m න් නැගෙනහිරට ද ඉන් පසු 20 m ක් දකුණට ද ගමන් කළේ ය.

(i) ඉහත තොරතුරු දැක්වෙන දළ රූප සටහනක් අඳින්න. (ල. 03)

(ii) ගමන් කිරීම අවසන් කළ පසු සචිනි දැන් සිටින්නේ නිවසේ සිට කුමන දිශාවෙන් ද? (ල. 01)

(iii) තලයක තිරස් බව හා සිරස් බව හඳුනාගැනීමට භාවිත කරන උපකරණවල නම් ලියන්න. (ල. 02)

06.(a) (i) 6 සාධක දෙකක ගුණිතයක් ලෙස දැක්විය හැකි ආකාරය පහත දක්වේ.

6 x 1 2 x 3

30 සාධක දෙකක ගුණිතයක් ලෙස දැක්විය හැකි ආකාර සියල්ල ලියන්න. (ල. 02)

(ii) සරඹ කණ්ඩායමක සිසුන් 40 ක් සිටී. එක් අයකුට රුපියල් 25 බැගින් බනිස් ගෙඩියක් ද, රුපියල් 30 බැගින් කිරිපැකට් එකක් ද දීමට තීරණය කරන ලදී. ඒ සඳහා වැය වන මුදල සොයන්න. (ල. 05)

(b) සුළු කරන්න.

(i) 5.62 + 12.3 (ල. 02)

(ii) 19.6 - 12.53 (ල. 02)

07.(a) (i) සවිධි චතුස්තලයක මුහුණතක හැඩය කුමක් ද? (ල. 02)

(ii) සවිධි චතුස්තලයේ මුහුණත් ගණන කොපමණ ද? (ල. 02)

(iii) දාරයක දිග 5 cm ක් වන සවිධි චතුස්තලයක ආකෘතියක් සකස්කර ගැනීමට ඔබට භාවිත කළ හැකි පතරමක් ඇඳ දක්වන්න. (ල. 02)

(iv) එම පතරමෙහි මිනුම් සඳහන් කරන්න. (ල. 02)

(b) එකිනෙකට සමාන සවිධි චතුස්තල දෙකක් මුහුණත් දෙකක්, එක මත එක වන පරිදි තබා ඇලවීමෙන් ඝන වස්තුවක් තනා ඇත. එම ඝන වස්තුවේ.

(i) මුහුණත් ගණන
(ii) දාර ගණන
(iii) ශීර්ෂ ගණන (ල. 03)